වවුනියාව උතුරු ප්‍රාදේශීය සභාව

වවුනියාව දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූලය ප්‍රකාශන 2016 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී සේවකයන්ට ලබාදී තිබූ ණය ප්‍රමාණය වර්ෂය අවසානයට වූ සේවක ණය ශේෂයට ඇතුලත්ව නොතිබුණි. ඒ අනුව සේවක ණය ශේෂය රු. 47,700 කින් අඩුවෙන් දක්වා තිබුණි. සභාවට අයිති වෙළඳ සැල් සඳහා ලබා ගන්නා ලද මූලික තැන්පතු මුදල් අඩුවෙන් දක්වා මෙම මුදල් ගලපා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව යටතේ පවතින මහාමාර්ග අළුත්වැඩියාව සඳහා රු. 2,540,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයතුල වියදම් කර තිබූ වටිනාකම පුනරාවර්ථන වියදම් වශයෙන් වර්ගීකරණය කර තිබුණි. එබැවින් එම ප්‍රමාණයෙන් ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අවසන් ගිණුම්වල ඇතුලත්ව තිබූ උපයෝජිත සේවා සඳහා වූ රු. 6,470,877 ක ණය මුදල හඳුනාගත නොහැකි ශේෂයක් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) වාර්ෂික භාණ්ඩ සමික්ෂණ මණ්ඩල වාර්තාවල දක්වා ඇති අතිරික්ත අයිතම 298 ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එම වටිනාකමින් සභාවේ ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව වෙළඳසැල් වලින් අයවිය යුතු එකතුව රු. 47,250 ක් වන කුලී ආදායම ආදායම් වශයෙන් ගිණුම් ගත කර නොතිබුණි. එබැවින්, සභාවේ ආදායම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු ගිණුම්

සේවයෙන් විශ්‍රාම ගිය, සේවයෙන් පහකළ, ස්ථාන මාරුවී ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු. 221,043 ක සේවක ණය ශේෂ වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

විගණනයට අවශ්‍ය තොරතුරු සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා රු. 2,107,104 ක් වටිනා ගණුදෙනු සම්බන්ධයෙන් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | සෑම මාස හයකට වරක්ම වාහනවල ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන්ම පුරවා වාහනය ධාවනය කොට ඉන්ධන පරි පරිභෝජය පරික්ෂා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති | |
| (i) රීති 217 | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ ලේඛනය නඩත්තු කර නොතිබුණි. |
| (ii) රීති v(7) | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (iii) රීති 153 | ලැබිය යුතු ශේෂ පිළිබඳ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. (ප්‍රා.ස.7) |
| (iv) රීති 163 | සාරාංශ ආදායම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. (ප්‍රා.ස. 19) |
| (v) රීති 60 | ප්‍රාදේශීය සභාව යටතේ ඇති කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් වර්ෂය ආරම්භයේදී පවත්වා නොතිබුණි. |

(vi) රීති 165 — ප්‍රධාන ලෙජරයේ වගකිම්, ආදායම් සහ වියදම් ලේඛන ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 11,053,803 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 557,760 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු. 10,496,043 ක් විය.

2.2 ආදායම් කළමනාකරණය
------------------------------

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය
------------------------------------------

අයවැය ඇස්තමේන්තු මැනවින් පිළියෙල කර නොතිබූ අතර ඇස්තමේන්තු සැලසුම් කිරිම සඳහා වැඩ සටහන් සකස් කිරීම මැනවින් සිදුකර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

2.2.2 උසාවි දඩ මුදල්
-------------------

උතුරු පළාත් ප්‍රධාන ලේකම් වරයාගෙන් ලැබිය යුතු රු. 1,854,537 ක උසාවි දඩ මුදල් අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු
----------------

රු. 1,708,764 ක මුද්දර ගාස්තු සභාව වෙත ඉඩම් රෙජිස්ටාර් ජනරාල්ගෙන් ලැබිය යුතු වුවද එම මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්
--------------------

ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ප්‍රචාරක ගාස්තු අයකර ගැනීම කටයුතු කර නොතිබූ අතර අදාල ආයතන විසින් ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අයවිය යුතු හිඟ ප්‍රචාරක ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

සභාව සන්තකයේ වාහන 16 ක් නොපැවතියද ඒවායේ අයිතිය සභාව සතුව ඇති අතර එම වාහනවල අයිති කාරත්වය පවරාදීමට විගණන වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 28,000 කට මිලදී ගෙන තිබූ ඇඟිලි සලකුණු යන්ත්‍රය 2016 දෙසැම්බර් දක්වා භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) කඩිනම් උතුරු ප්‍රති සංවිධාන සැලැස්ම යටතේ රු. 26,137,591 ක වියදමින් ඉදිකරන ලද බස් නැවතුම් පොල භාවිතයට ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද 2011 අගෝස්තු 12 දින සිට අද දක්වා එය නෙඩුන්කර්නි ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි.

4.3 ගිණුම්කරණ භාවය සහ යහපාලනය

-----------------------------------------

4.3.1 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

----------------------------------------------

ප්‍රාදේශීය සභාවේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යෑම උදෙසා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් එකතු කිරීම්.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය.